(95)

දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

2784832
2784807
2785617

2784812

2785141-50
Fax: 2784846

ඊ-මේල්/மின்னஞ்சல்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..............................................

අධ්‍යාපන අමාත්‍යාංශය 250
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } ඊඩී/5/68/3/1/11

දිනය / திகதி / Date } 2005.06.23

චක්‍රලේඛ අංක : 2005/14

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

## <u>පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා අධ්‍යයන නිවාඩු ලබා දීම.</u>

ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ පුස්තකාල සහ තොරතුරු විද්‍යායතනය (NILIS) මගින් පවත්වනු ලබන පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර (සති අන්ත) පාඨමාලාව සඳහා සහභාගී වන ගුරුවරුන්ට එම පාඨමාලාවේ සති අන්තවල පැවැත්වෙන දේශන හා සැසි වලට සහභාගිවීම සඳහා එම සති අන්තවලට පෙර දින වන සිකුරාදා දිනට පහත සඳහන් කොන්දේසි වලට යටත්ව අධ්‍යයන නිවාඩු අනුමත කළ හැකි වේ

1. පාඨමාලාව ආරම්භ කිරීමෙන් පසු දේශන හෝ සැසි පැවැත්වෙන සති සඳහා පමණක් අදාල සතියේ සිකුරාදා දින අධ්‍යයන නිවාඩු ලබා ගත යුතු අතර පාඨමාලාව සඳහා සහභාගී නොවන සති අන්තයන්හි දී මෙම නිවාඩු හිමි නොවේ.
2. පාඨමාලාව සම්පූර්ණ කිරීම පිණිස 80% ක දේශන සහභාගීත්වයක් තිබිය යුතු අතර එසේ නොවන්නේ නම් ලබා ගත් අධ්‍යයන නිවාඩු සියල්ල අවලංගු කළ යුතු වේ.
3. අයදුම් කරනු ලබන සියලුම අධ්‍යයන නිවාඩු සඳහා පැමිණීමේ සහතික මාසිකව පාඨමාලාව මෙහෙයවනු ලබන ආයතනය මගින් පාඨමාලා ලාභීන් ගේ ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.
4. මෙම චක්‍රලේඛ විධිවිධානයන් අනුව යථෝක්ත පාඨමාලාවට සහභාගී වන ගුරුවරුන් සඳහා දෙනු ලබන අධ්‍යයන නිවාඩුව රාජකාරි ස්ථානයේ සිට කිලෝමීටර් 48 ක් හෝ ඊට වැඩි දුරක සිට පැමිණෙන අය සඳහා පමණක් හිමිවේ.

ඉහත කොන්දේසි යටතේ මෙම පාඨමාලාව හදාරන ජාතික පාසල් වල ගුරුවරුන් සඳහා අධ්‍යයන නිවාඩු අනුමත කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

(අත්සන)

වෛද්‍ය තාරා ද මෙල්
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් : 1. අතිරේක ලේකම්වරුන්
2. සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
3. සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්